# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

**සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය දෙකයි.**

නම / අංකය : .......................................................................... **9 ශ්‍රේණිය**

### I කොටස

*** සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01.අකුරක් හැඳින්වීමට නිවරදිම ප්‍රකාශය වන්නේ

1.රූපකයකි. 2.හැඩතලයකි. 3.ශබ්ද සංකේතයකි. 4.කල්පිතයකි.

02. නූතන සිංහල අක්ෂර මාලාවේ මහප්‍රාණ අක්ෂර ගණන වන්නේ

1.පහයි. 2. දහයයි. 3. අටයි. 4. දහ අටයි.

03. සෑම පදයකටම සඤ්ඤක අක්ෂරයක් යෙදුණු පද පේළිය වන්නේ

1. නළ,වනය,අඟ, නුබ
2. තඹ, ඇණය, ඥානය,කඳ
3. රඹ,සඳ,මඳ, සුළඟ
4. පහළ, වර්ණ, රජ, බඳ

04. අකුරු මනින ඒකකය හැඳින්වෙන්නේ

1. කැලරි 2. මාත්‍රා 3. පනම 4. පවුම නම්නි.

05. අග පදයෙහි අර්ථයන් සහිත යුගල පද වර්ගයට අයත් පදය වන්නේ

1. ඉමක් කොනක්
2. යාන වාහන
3. දඩස් බඩස්
4. රණ්ඩු සරුවල්

06. නිපාත පදයක් නොවන පදය

1. තෙක් 2. දක්වා 3. පටන් 4. තව

- ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කිරීමට සුදුසු පදය තෝරන්න.

07. නොදන්න දෙමළට ගිහින් ......................... නහ ගත්ත වගේ.

1. පවුල 2. වරිගෙ 3. දිවි 4. පණ

08. පය බරවායට ........................ බෙහෙත් බැන්දා වගෙයි.

1. හිසේ 2. කකුලේ 3. නළලේ 4. පිටිකර

- පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පද කවර ව්‍යාකරණ වර්ගයකට අයත් දැයි තෝරන්න.

09. දරුව මෙහි එන්න.

1. මිශ්‍ර ක්‍රියා  2. විධි ක්‍රියා
3. පූර්ව ක්‍රියා  4. අසම්භාව්‍ය ක්‍රියා

10. අව්‍ය පද යනු

1.නිපාත පදයි.  2. උපසර්ග පදයි.
3. තද්ධිත පදයි.  4. නිපාත සහ උපසර්ග දෙකටම අයත් පදයි.

11. ප, ඵ, බ, භ, ම අක්ෂර අයත්වන කාණ්ඩය වන්නේ

1. දන්තජ  2. මූර්ධජ  3. ඕෂ්ඨජ  4. තාලුජ

- හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

12. ගංගා ගලා ..................

1. බසිති.  2. බසියි.  3. බසින්නෝය.  4. බසින්නාහ.

13.මින්......... ගංවෙරළට රැස්වෙති.

1.දද  2.පසු  3. අනතුරුව  4. රැල

14. තුරු පෙළ සුළඟට ...........

1. වැටෙති.  2.සෙලවෙති  3. ඇඹරෙති.  4.සෙලවෙයි.

15.සමානාර්ථ පද පමණක් ඇති පද පේළිය තෝරන්න.

1. කනක, කාංචන, සිංධු, කසුන්  2. තුරු,රුක්, දරිද්‍ර,දුමිදු
3. ප්‍රමෝදය,තොස,හර්ෂය,උදක  4. ජලය ,අඹ,උදක, දිය

16. අකාරාදි පිළිවෙලට වචන යෙදී ඇති වරණය තෝරන්න.

1.කතරගම,ගම්පහ,මහරගම,රත්මලාන  2.ජපානය,නයිජීරියාව,එංගලන්තය,ඇමරිකාව
3.වලසා,දළඹුවා,මයිනා,රිලවා  4.සමන්පිච්ච,රෝස, වතුසුද්ද,ඉද්ද

17.රජතුමා ගමන් කල දෝලාව රෝද නැති කරත්තයක් වගේය.

මෙහි සදහන් උපමාව වන්නේ,

1.දෝලාව  2. කරත්තය
3.රෝදනැති කරත්තයක්  4.ගමන්කල දෝලාව

18. පෞරුෂත්වය යන පදයේ නිවරදි පිල්ලම් වන්නේ

1. කොම්බුව,ගයනුකිත්ත, ඇදය,ඉස්පිල්ල
2. කොම්බුව,ගයනුකිත්ත,පාපිල්ල,හල්කිරීම
3. කොම්බුව,ගැටපිල්ල,ඇදපිල්ල, ඉස්පිල්ල
4. කොම්බුව,ඇලපිල්ල, ඇදය ඇදපිල්ල

19. ඉහේ මලක් පිපුණා යන පදය

1.උපමාවකි 2.රූපකයකි.

3.නිපාතයකි. 4.රූඪී පදයකි.

20. උක්ත පද පමනක් යෙදී ඇති පද පේළිය වන්නේ

1. සමහරෙකු, වෙළෙන්දෙක්, මිනිසා, ඕ
2. ගැහැණියක්,තෝ, ළමයෙක්,ඔවුහු
3. සමහරු, ඇතමෙකු, අප,ගුරුවරයා
4. ශිෂ්‍යාවක, මිනිසෙක්, හාවෙක්, ඇය

(ලකුණු 2 x 20 = 40)

II කොටස

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01.ඔබේ සිංහල ගුරුතුමා ඔබේ පන්තිය කණ්ඩායම් පහකට බෙද බිත්ති පුවත්පතක් සැදීමට ඔබට පැවරුමක් ලබා දුන්නේයැයි සිතා එම ක්‍රියාකාරකම ඇසුරින් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ඔබ එම බිත්ති පුවත් පතට යෙදූ නම කුමක්ද?
2. කණ්ඩායම් පහට ඔබ පැවරූ වැඩ මොනවද?
3. එහිදී එබ ට ඇතිවූ ගැටලු මොනවාද?
4.ඔබ ඒ සදහා යොදගත් තේමාව කුමක්ද?
5. එම ක්‍රියාකාරකමෙන් ඔබ ඉගනගත් දෙයක් ලියන්න.

(ලකුණු 2 x 5 = 10)

02. කැමති මාතෘකාවක් තෝරාගෙන වචන 200ට නොඅඩු රචනාවක් ලියන්න.

1. ලොව මවිත කල විද්‍යාඥයෝ.
2. මම හොද මිණිසෙක් වී රටට සේවය කරමි.
3. විද්‍යාවේ දියුණුව නිසා.
4. ගැමි දිවිය සරු කල ජන කවි.
5. එය මට කිසිද අමතක නොවේ. (ලකුණු 20)

03. මාරාන්තික කොරෝනා වෛරසය අසාදනය වීමෙන් වැලකීම සදහා ප්‍රදේශවාසීන් දැනුම්වත් කිරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න.

(ලකුණු 15)

04. පෙලපොතේ උධෘත ඇසුරින් පිළිතුරු ලියන්න.

**i. "එයද කළ හැකි වන්නේ ඔබට පමණයි"**

1. මෙම ප්‍රකාශය කා විසින් කා හට කියන ලද්දක් ද? (ලකුණු 2)
2. මෙහි සදහන් කලහැකි දෙය කුමක්ද? (ලකුණු 1)
3. මෙම කොටස ඇතුලත් පාඩම උපුටා ගත් පොත කුමක්ද? (ලකුණු 1)

**ii. "කට දහසක් ඇතුව කිවත් නුඹෙ ගුණ නැත නි මිමා**
**වට දහසක් ගව් හිමයේ ගියදෝ අපෙ අ මිමා"**

1. මෙම කවියේ මුල් පද දෙක ලියන්න. (ලකුණු 2)

**iii. "පුතේ මම බෙරේ කරේ දගෙන හැතැක්ම ගණන් පයින් ගිය කෙනෙක්"**

1.මෙසේ පයින් ගිය ශේෂ්ඨ පුද්ගලයා කවුද? (ලකුණු 1)

2. ඔහු හැදින් වූ විරුද නාමය ලියන්න. (ලකුණු 1)

05. පහත සදහන් පද්‍ය ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

කරුණා මහිම කොයි තරමද කිවොත් ඔබේ
මැවුණා මහා ගංගාවල් ලෙසින් ඉබේ
ඉනුණා බසින දියරක් තැවරුනොත් මොබේ
මරනාසන්න හුස්මට මුත් ආසි ලැබේ

1. මහා ගංගාවල් මැවී ඇත්තේ කුමක් නිසාද? (ලකුණු 2)

2.මහිම ආසි යන පදවල තේරුම ලියන්න. (ලකුණු 2)

3. මෙහි අගපද දෙකෙහි තේරුම ඔබේ වචනෙන් ලියන්න. (ලකුණු 2)
4. කිවොත් යන පදය අයිති ව්‍යාකරණ වර්ගය කුමක්ද? (ලකුණු 1)

(ලකුණු 15)